
# පළමුවන තේමාව - ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය

3

## 1.3. ලොව විස්මිත මැවිල්ල වූ මිනිසා



මේ පින්තූරයෙන් හා ගීතිකාවෙන් ඔබට හැඟෙන්නේ මොනවා ද? මේ ගැන මඳක් මෙනෙහි කරන්න. ඔබේ සිතට නැඟෙන අදහස් පංති කාමරයේ දී ඉදිරිපත් කරන්න.

**කැමති ලෙසින් අඹනු මැනවි මා**

කැමති ලෙසින් අඹනු මැනවි මා
දිව්‍ය කලාකරුවාණෙනි
මැටි පිඩක් ය මා ඔබේ අතේ
ඔබ කැමති හැඩක් රුවක් අඹන්න සමිඳේ

මම නොදනිමි ඔබේ සිතේ තිබෙන මගේ හැඩේ
මට නොහැගේ උතුම’හිමත සැලසුම් ඔබගේ
මගේම යයි මෙතෙක් දුටුව මාවත අඳුරේ
මහා කලාකරුවාණෙනි දැන් එය වැටහේ

මටම දිනෙක සතුටු වන්න පිළිවන් වන්නේ
ඔබේ අතින් මා හැදුණොත් ලද දුක් අතරේ
මිනිස් දුබලකම නිසාම වේදනා දූනේ
නමුත් සමිඳෙ අඹන්න මා ඔබ කැමති ලෙසේ

(කිතුනු ගී 487)

(පුබුදු ගීතාංජලී 96)

## මැවීම පිළිබඳ පළමු කථාව

මානව වර්ගයාගේ
ආරම්භය ගැන කථා කරන විට
කිතු දහම අනුව අපගේ මනස දිව යන්නේ
ශුද්ධ බයිබලයේ පංච පුස්තකය වෙත ය.

උත්පත්ති පොතේ මුල් පරිච්ඡේදයේ
26 වන වගන්තියේ සිට 28 වන වගන්තිය
දක්වා වූ මැවීම පිළිබඳ පළමු කථාවෙන්
මෙවැනි විස්තරයක් අපට දෙයි.

ඉන්පසු දෙවියන් වහන්සේ, "අපගේ ස්වරූපයට අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු. ඔහු මුහුදේ මසුන් ද අහසේ පක්ෂීන් ද ගව මහීෂයන් ද මුළු පොළෝ තලයෙහි සියලු වන මෘගයන් ද උරගයන් ද පාලනය කෙරේවා!"යි අණ කළ සේක.

දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක; දෙවියන් වහන්සේගේ ම ස්වරූපය අනුව ඔවුන් මවා වදාළ සේක. පුරුෂයා ද ස්ත්‍රිය ද වශයෙන් ඔවුන් මැවූ සේක.

(උත්පත්ති 1:2627)

පූජක සම්ප්‍රදාය මත ගොඩනැගුණු මැවීමේ පළමු කථාවට අනුව දෙවියන් වහන්සේ තම ස්වරූපයට හා සමානකමට අනුව මිනිසා ව මැවූ සේක. පුරුෂයා ද ස්ත්‍රිය ද වශයෙන් ඔවුන් මවා මුළු පොළොවේ ම ආධිපත්‍යය ඔවුනට දානය කරමින් ලෝකය වැඩි වර්ධනය කර පූර්ණත්වයට ගෙන ඒමේ වගකීම පැවරූ සේක.

**මේ ගැන සිතන්න.**

> "එහෙත් ඔබ, මිනිසා මවා ඇත්තේ,
> දෙවිඳුන්ට පමණක් දෙ වැනි වන ලෙසින් ය.
> තෙද යස කිරුළක් ඔහු හිස පළඳන ලද්දේ ය.
> ඔබ මැවූ හැම දේ, ඔහුට යටත් කළ සේක."
>
> (ගීතාවලිය 8:56)

**දේව සමානකම යනු**

1. **ප්‍රඥාව හා තේරුම් ගැනීමේ ශක්තිය:**
   **දෙවියන් වහන්සේ ගැනත්, මිනිස් සමාජය ගැනත්, භෞතික ලෝකය හා විශ්වය ගැනත් දැනුම ලබාගැනීමේ හැකියාව මිනිසා සතු වේ.**

2. **නිදහස් කැමැත්ත:**
   **තෝරාගැනීමට හා තීරණ ගැනීමට ඇති හැකියාව යි.**

3. **අමරණීයත්වය:**
   **ශරීරය දිරාපත් වුව ද මිනිසාගේ ආධ්‍යාත්මිකත්වය විනාශ වන්නේ නැත. ඊට අත්තිවාරම් වන ආත්මය අමරණීය වේ.**

## මැවීම පිළිබඳ දෙවන කථාව

මනුෂ්‍යයාගේ මැවීම සම්බන්ධ යාවේ සම්ප්‍රදාය මත ගොඩනැගුණු දෙවන කථාව මෙසේ ය.

> "දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ඔහුගේ නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළූ සේක. මෙසේ මනුෂ්‍යයා ජීවමාන කෙනෙක් විය."
>
> (උත්පත්ති 2:7)

මනුෂ්‍යයා පසින් සාදා ජීවන හුස්ම දානය කරන්නේ දෙවියන් වහන්සේ ම ය. එම ප්‍රාණය දානය කරන්නේ "ජීවමාන වේවා"යි යන වචනයකින් නොව තමන් වහන්සේගේ ම ජීවනය මනුෂ්‍යයාගේ නාස් පුඩු තුළට දානය කිරීමෙනි. එලෙස ම එ මගින් මනුෂ්‍යයා හා දෙවියන් වහන්සේ අතර ඉතා කිට්ටු සබැඳියාවක් ඇති බව පැහැදිලි වේ.

### පරිණාමීය මනුෂ්‍යයා

පරිසරය සමඟ ගැටීමේ දී ටිකින් ටික වෙනස් වී ඉතා දීර්ඝ කාලයකට පසු මුල් ස්වභාවයට මුළුමනින් ම වෙනස් වූ ස්වරූපයකට පත්වීම පරිණාමය යි. සොබාදහමේ ක්‍රියාවලිය නිරන්තරයෙන් ම සරලත්වයේ සිට සංකීර්ණත්වයටත් සංකීර්ණත්වයේ සිට අති සංකිර්ණත්වයටත් ගමන් කරයි.

මිනිසාගේ ආරම්භය හා පැවැත්ම ගැන විවිධ න්‍යායයන් ඉදිරිපත් කර ඇත. චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදය, සුමේරියානු කථාව, ප්‍රසාරණය වීමේ න්‍යාය, බිග් බැන්ග් න්‍යාය හා ලාප්ලාස්ගේ නිහාරික කල්පිතය එවැනි න්‍යායයන්ට නිදසුන් කීපයකි.

විශ්වයේ ආරම්භය පිළිබඳ ව සියලුදෙනා ම පිළිගත් න්‍යායයක් හෝ මැවීමේ කාර්යය ඇසින් දුටු විද්‍යාඥයෙක් හෝ නොමැත. විශ්වයේ අර්ථය පහදා දීමට විද්‍යාවට නොහැකි ය. ඩාවින්ගේ පරිණාම වාදයට අනුව අජිවී මූලික පරමාණුවෙන් ජීවිතය ඇති වූ ආකාරය විස්තර නො කරයි. සමහර විද්‍යාඥයින් පරිණාමය සලකනුයේ උසස් මට්ටමක සම්භාවිතාවක් ඇති එහෙත් තව ම ස්ථාපිත කර නො මැති කල්පිතයක් පමණක් වන බව යි.

විද්‍යාත්මක චින්තනය මිනිසා නව මගකට යොමු කර ඇත. නව විද්‍යාත්මක සොයාගැනීම් කිතුනු විශ්වාසය ශක්තිමත් කරයි. විද්‍යාව හා කතෝලික විශ්වාසය පරස්පර නොවේ. නිදසුනක් ලෙස මිනිසාගේ ශරීරය භූමියේ දූවිල්ලෙන් සකස් කරනු ලැබූ බව ශුද්ධ වූ බයිබල් කතුවරයා පවසයි. දූවිල්ල මූල ද්‍රව්‍ය 96 කින් යුක්ත බවත් මිනිස් සිරුර ද එලෙස ම මූල ද්‍රව්‍ය 96 කින් යුක්ත බවත් විද්‍යාත්මක ව සනාථ වී ඇත. මැවිල්ල සිදු වූ බවට කෙතරම් අගනා සාක්ෂියක් ද?

මිනිසා මැවීම පිළිබඳ ව උත්පත්ති පොතේ කතුවරයා ඉදිරිපත් කරන්නේ විශ්වාසයේ සත්‍යතා මත ය. ස්වභාව ධර්මයේ ඇති වන වෙනස්කම් විශ්වාසයට බාධාවක් නොවේ. විද්‍යා දැනුම අපට නො මැති වුවත් අප සඳහා විශ්වයේ මූලාරම්භය හා ඉලක්කය පිළිබඳ තොරතුරු දෙවියන් වහන්සේ විසින් එළිදරව් කර ඇත.

අද මිනිසා පරිණාමය වන්නේ දැනුමෙන් හා හැකියාවෙන් ය. මිනිස් සිරුරට ඉන්ද්‍රිය ඥාන පහක් ඇත. ඒවා දැකීම, ඇසීම, ගඳ සුවඳ දැනීම, රස විඳීම හා ස්පර්ශය ලෙස දැක්විය හැකි ය. මේවා ප්‍රකාශ කරනුයේ භෞතික ශරීරය මගිනි.

දෙවියන් වහන්සේ
මිනිසා මවා ඇත්තේ තමන් වහන්සේගේ
ස්වරූපයට හා සමාන කමට ය.

ආධ්‍යාත්මික හා අමරණීය ආත්මයකින්
සැදුම් ලත් හෙතෙම නිතැතින් ම
යහපත සහ සත්‍යය කරා ඇදී යයි.

භාග්‍ය සම්පන්න, සදාතනික
මතු ජීවිතයකට යොමු වේ.

**ක.ස.ධ. 17011704**

**මේවා ඔබට කළ හැකි දැ යි බලන්න.**

පන්තිය කුඩා කණ්ඩායම් පහකට වෙන් කරන්න.

පහත සඳහන් මාතෘකා කණ්ඩායම් හතරක් අතර බෙදා ගන්න.

1. සත්ත්ව ලෝකය : සිව්පා හා උරග
2. ශාක ලෝකය : ගස් වැල්
3. පක්ෂීන්
4. මානවයා

**පහත සඳහන් වර්ග යටතේ ඒවා වර්ග කිරීමට යොමු වන්න.**

1. වර්ග 3. ව්‍යාප්තිය

2. විකාශනය 4. වර්තමාන තත්ත්වය

**නිදර්ශනය** **1. සත්ත්ව ලෝකය**

| | සිව්පා | උරග |
|---|---|---|
| 1. වර්ග<br>2. විකාශනය<br>3. ව්‍යාප්තිය<br>4. වර්තමාන තත්ත්වය | | |

- 5 වැනි කණ්ඩායම "මිනිසා දේව මැවිල්ලක්" යන්න විග්‍රහ කිරීම සඳහා අදාළ ශුද්ධ බයිබල් පාඨ පරිශීලනය කරමින් විස්තරයක් ඉදිරිපත් කිරීමට යොමු වන්න.


- ඔබේ අභ්‍යාස පොතේ මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

  1. මිනිසාගේ ආරම්භය හා පැවැත්ම ගැන ඉදිරිපත් වී ඇති විවිධ න්‍යායයන් හතරක් නම් කරන්න.

2. පරිණාමවාදය බයිබල් පණිවිඩයට පටහැනි ද? විස්තර කරන්න.

3. ශුද්ධ වූ බයිබලයේ උත්පත්ති කතුවරයා ප්‍රකාශ කරන මිනිසා ලැබූ කැඳවීම කුමක් ද?

4. අද මනුෂ්‍යයා පරිනාමය වන්නේ කවර අංශවලින් ද?



මිනිසා දේව මැවිල්ලක්


නොමිලේ බෙදා හැරීම සඳහා ය.